ඔබේ මුදලින්, ඔබේ ජීවිතයෙන් හා ඔබේ දිවෙන් මිථ්යාදෘෂ්ටික බහුදේව වාදීන්ට එරෙහිව අරගල කරනු

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අනස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "ඔබේ මුදලින්, ඔබේ ජීවිතයෙන් හා ඔබේ දිවෙන් මිථ්යාදෘෂ්ටික බහුදේව වාදීන්ට එරෙහිව අරගල කරනු." [صحيح] [رواه أبو داود والنسائي وأحمد]

දේවත්වය ප්රතික්ෂේප කරන කලහාකාරී මිථ්යදෘෂ්ටිකයින් සමග අරගල කරන මෙන් ද ඔවුනට මඟපෙන්වීමේ දී තමන්ට හැකි සෑම ක්රියාමාර්ගයක් යොදවා කැපවන මෙන් ද නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ නියෝග කළහ. එය අල්ලාහ්ගේ ප්රකාශය උසස් කරවනු පිණිසය. පළමුවැන්න: ඔවුන් සමග කරන අරගලයේ අවශ්ය කළමනා මිලදී ගැනීම, ඒ සඳහා කැපවන මුජාහිද්වරුන් හට වියදම් කිරීම වැනි කටයුතු සඳහා මුදල් වැය කිරීම ය. දෙවැන්න: ඔවුන් හමුවීමටත් ඔවුන් වළක්වාලීමටත් තම ආත්මය හා ශරීරය කැප කිරීම. තුන්වනුව: මෙම දහම වෙතට ඔවුන්ට මුවින් ඇරයුම් කිරීම, ඔවුනට සාධක ඉදිරිපත් කිරීම, ඔවුන්ව නරකින් වැළක්වීම හා ඔවුනට ප්රතිචාර දැක්වීමය.

https://sunnah.global/hadeeth/si/show/64597